# නාම රූප

කාලය යන සංකල්පය ඇතිකරගැනීමේ දී තොරතුරු රැස්කිරීම හා තොරතුරු ආපසු ලබාගැනීමට අමතර ව විඥානය යන්න ද අවශ්‍ය වෙයි. ඒ අර්ථයෙන් විඥානයක් නොමැති කිසිවකට කාලය යන සංකල්පය ඇති නොවෙයි. එහෙත් විඥානයක් නොමැති සාමාන්‍ය වස්තු ද කාලයෙහි ඉදිරියට යන්නේ යැයි අපි කියමු. බසයකට අද මහනුවරින් පිටත් වී ඊයේ කොළඹට නොපැමිණියහැකි ඇයි?

මෙය නිව්ටෝනීය භෞතිකයෙහි පැන නගින ප්‍රශ්නයකි. බසයට කාලය පිළිබඳ සංකල්පයක් නැත. එසේ නම් බසය කාලය සම්බන්ධයෙන් ගත්කල ඉදිරියට ම යන්නේ ඇයි? එයට හේතුව බසයට කාලය පිළිබඳ සංකල්පයක් නොමැති වුවත් බසයේ රියැදුරුට හා මගීන්ට කාලය පිළිබඳ සංකල්පයක් තිබීම ද? ඔවුන්ට කාලයේ ආපස්සට යා නොහැකි බැවින් ඔවුන් රැගත් බසයට ද කාලයෙහි ආපස්සට යා නො හැකි ද? හේතුව එය නම් මිනිසුන් හෝ විඥානයක් සහිත වෙනත් ජීවීන් හෝ නොමැති වස්තුවකට කාලයේ ආපසු යා හැකි ද?

නිව්ටෝනීය භෞතිකයෙහි අංශු හා වස්තු චලනයවන්නේ බාහිර බල අනුව ය. ස්කන්ධය නියතයක් වූ අංශුවක් හෝ වස්තුවක් හෝ මත බාහිර බලයක් ක්‍රියාකරන්නේ නම් එය අවස්ථිති සමුද්දේශ රාමුවක ත්වරණයකින් චලනයවෙයි. බාහිර බලයක් නොමැති නම් අංශුව හෝ වස්තුව හෝ ඒකාකාර ප්‍රවේගයකින් චලනය වෙයි. අපි පහසුව සඳහා දෙවැනි අවස්ථාව, එනම් බාහිර බලයක් නොමැති අවස්ථාව සලකමු. අපට ප්‍රශ්නය වන්නේ අංශුවට හෝ වස්තුවට හෝ ඒකාකාර ප්‍රවේගයකින් කාලයේ ආපස්සට යෑමට නො හැකි ද යන්න ය.

මේ ප්‍රශ්නය ඇසීමේ දී අප උපකල්පනය කරන යම් වැදගත් කරුණක් වෙයි. එනම් අංශුවක් හෝ වස්තුවක් හෝ යනුවෙන් යමක පැවැත්ම ය. අංශුවක් හෝ වස්තුවක් හෝ ලෙස දිගින් දිගට (දිගින් දිගට යැයි කී විට එහි කාලය යන සංකල්පය අන්තර්ගත වී ඇති බව සැලකිය යුතු ය.) පවතින යමක් වෙයි ද? ඒ ප්‍රශ්නයට පිළිතුර ඔව් නම් ඉන් කියැවෙන්නේ ආත්මවාදය පිළිගැනීමකි. සිංහල බෞද්ධයන් ලෙස එවැනි ආත්මවාදී ස්ථාවරයක් ගැනීමට අපට නො හැකි ය.

වස්තුවක් වෙනස්වන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට එකල අනුරාධපුරයෙහි වැඩසිටි භික්ෂූන් වහන්සේ ඉතා වැදගත් පිළිතුරක් දී ඇත. මහාචාර්ය වයි කරුණාදාස මහතාට අනුව මේ පිළිතුර සමග දිගින් දිගට පවතිමින් වෙනස්වන වස්තුවක් වෙනුවට පැරණි සිංහල භික්ෂූන්වහන්සේ ක්‍රියාවලියක් යන්න හඳුන්වාදුන්හ. පැරණි භික්ෂූන්වහන්සේ දුන් පිළිතුර ගැන අපි කලින් ද සාකච්ඡාකර ඇත්තෙමු. ඒ අනුව ඇතිවී නැතිවී යන ක්‍රියාවලියක් මිස වස්තුවක් ලෙස ගතහැකි කිසිවක් නැත.

මේ පිළිතුර තවදුරටත් වර්ධනයකිරීමේ දී පෙනීයන කරුණ නම් එසේ ඇතිවී නැතිවී යන වස්තුවක් යම් ක්ෂණයක දී හෝ පවතින්නේ යැයි ගැනීම ද ආත්මවාදී බව ය. ක්ෂණයක හෝ පවත්නා වස්තුවක් ඇතැයි අප උපකල්පනයකරන්නේ අපට එසේ නොකර බැරි නිසා ය. අපේ මනසට අනිත්‍ය හා අනාත්ම අවබෝධ නො වෙයි. මා දකින අයුරින් බුදු දහමෙහි සඳහන්වන අනිත්‍ය හා අනාත්ම සංකල්ප වශයෙන් අවබෝධකරගැනීමට නො හැකි ය. මනස ලෝකය අවබෝධකරගන්නේ, එනම් ලෝකය නිර්මානයකරන්නේ සංකල්පීය වශයෙන් ය. මනසට ගතහැකි කුඩාම සංකල්ප වෙයි. මේ සංකල්ප චිත්ත, චෛතසික, රූප වශයෙන් හැඳින්වෙයි.

රූප ලෙස මනසට ගතහැකි කුඩාම කොටස ඇතිවී නැතිවන්නක් ලෙස ගැනීම හැරෙන්නට මනසට කළහැකි අන්කිසිවක් නැත. ඒ කොටස තවත් කුඩා කොටස්වලට බෙදීමට මනසට නො හැකි ය. මේ විශ්ලේෂණයෙහි සීමාව ය. බටහිර විද්‍යාවට හෝ වෙනත් විද්‍යාවකට හෝ මේ සීමාවෙන් ඔබ්බට යා නො හැකි ය. ථෙරවාදී අභිධර්මයෙහි

© Prof. Nalin De Silva

දැක්වෙන රූප සංකල්පය අපේ පැරණි සිංහල භික්ෂූන්වහන්සේට ඇතිවී නැතිවී යන දෑ හි ක්‍රියාවලියක් ලෙස වෙනස්වීම හඳුනාගැනීමට උපකාර වන්නට ඇතැයි සිතිය හැකි ය.

වස්තුවක් යනු එසේ ඇතිවී නැතිවන දෑහි ක්‍රියාවලියක් ලෙස ගත්විට ඒ ඇතිවී නැතිවන දෑ අපට මනසින් ගතහැකි කුඩා ම කොටස් ලෙස හඳුනාගැනීමට සිදුවන අතර තවත් කරුණක් ගැන සිත යොමුකිරීමට සිදුවෙයි. එනම් ඒ ඇතිවී නැතිවන දෑ අතර සම්බන්ධයක් ගොඩනැගී ඒ එක් වස්තුවක් ලෙස ක්‍රියාකරන්නේ කෙසේ ද යන්න ය. ඇති වී නැතිවන දෑ එකිනෙකින් ස්වායත්ත නම් ඒ සියල්ලෙන් වස්තුවක් යැයි කිවහැකි දෙයක් නිර්මානය නො වෙයි. අපේ පැරණි භික්ෂූන්වහන්සේ මෙ කරුණ පිලිබඳ සිය අවධානය යොමුකළ බවක් නො පෙනෙයි. මේ ගැටළුවෙන් මිදිය හැකි මගක් වෙයි. ඒ එසේ ඇතිවී නැතිවන දෑ එක එකක් අනුගාමීව ඇතිවන්නට තොරතුරු ලබාදෙන්නේයැයි උපකල්පනය කිරීමෙන් ය.

අප විසින් කරන ලද්දේ පැරණි භික්ෂූන්වහන්සේගේ ආකෘතියට මේ තොරතුරු ලබාදීම යන අදහස ඇතුළත්කිරීම ය. ඒ සමග අපට ඊනියා දිගින් දිගට පවතින වස්තු ලැබෙයි. එපමණක් නොව මනස සම්බන්ධයෙන් ද එවැනි ම වූ ආකෘතියක් අපි තනාගත්තෙමු. මනස ද ඇතිවී නැතිවන චිත්තවල ක්‍රියාවලියක් පමණක් වෙයි. එහෙත් එසේ ඇතිවී නැතිවන චිත්ත එක එකක් අනුගාමී ව ඇතිවන චිත්තයට තොරතුරු සපයයි. ඒ චිත්ත එකතු වී මනසක් නිර්මානයවන්නේ එලෙස තොරතුරු සැපයීම හා ලබාගැනීම හේතුවෙන් ය.

මනස මෙන් ම වස්තුව ද තොරතුරු සැපයීම හා ලබාගැනීම මත පදනම් වී නිර්මානය වෙයි. මනස, වස්තු වැනි ද්‍රව්‍යයන්ගෙන් වෙනස්වන්නේ තොරතුරු ලබාගන්නා චිත්තය ඒ තොරතුරු හේතුවෙන් තමා යනුවෙන් අයකු ඇති බව සවිඥානික ව නිර්මානය කිරීමෙන් ය. චිත්තය එයට ලැබුණු තොරතුරු මත පදනම් වී වස්තුවක් (ද්‍රව්‍යයක්) විසින් නොකෙරෙන වෙනත් දෙයක් කරයි. ඒ ලැබෙන තොරතුරු පිළිබඳ දැනුවත් වීම ය. නාම රූප අතර වෙනස මෙය වෙයි. නාමය බුදුන්වහන්සේ වේදනා සංඥා සංඛාර විඥාන යනුවෙන් එකිනෙකට සම්බන්ධ වූ කොටස් හතරකට කඩති. රූපයට නැති මේ කොටස් හතරෙන් කියැවෙන්නේ නාමයට තමා ගැන දැනීමක් (වේදනා), විඥානයක් ඇති බව ය. ඒ නාමයට සංඥා ලබාගැනීමට හැකි අතර සංඥා ගැන සංඥා ලෙස දැනුවත් වීමට ද හැකි ය. එපමණක් නොව සංඛාර ද වෙයි. එනම් යම් යම් දෑ සංස්කරණයකිරීමේ හැකියාව ද නාමයට වෙයි. ඒ සංස්කරණයකෙරෙන දැයින් පළමුවැන්න වනුයේ තමා නැත්නම් නාමය ය. මනස යනු ද එසේ සංස්කරණය කෙරෙන්නක් මිස අනෙකක් නො වෙයි.

මනසට ඉන්පසු අනෙක් මනස් ගැන මෙන් ම රූප ගැන ද සවිඥානික දැනුමක් වෙයි. එහෙත් ද්‍රව්‍යයට හෙවත් රූපයට එවැනි සවිඥානික දැනුමක් නැත. ද්‍රව්‍යයෙහි ද තොරතුරු වෙයි. ද්‍රව්‍යයද ඇතිවෙමින් නැතිවෙමින් පවතින්නේ යැයි අප විසින් ගැනෙන රූප පද්ධතියකි. ඒ රූප එක එකක් අනුගාමී රූපයට තොරතුරු සපයයි. එහෙත් රූපවලට තොරතුරු ලබාගැනීම පිළිබඳ සවිඥානික හැඟීමක් නො වෙයි. රූපය ඒ ලබාගන්නා තොරතුරු ඇසුරෙන් තමා යන සංකල්පය නිර්මානය නොකරයි.

මෙහි දී නැවතත් අවධාරණය කළයුතු කරුණක් වෙයි. එනම් චිත්තයක් හෝ රූපයක් හෝ විසින් අනුගාමී චිත්තයට හෝ රූපයට හෝ ලබාදෙන්නේ එයට ලැබුණු තොරතුරු ඒ ආකාරයෙන් ම නොවන බව ය. චිත්තයක් හෝ රූපයක් හෝ එයට ලැබුණු තොරතුරු සියල්ල අනුගාමී චිත්තයට හෝ රූපයට හෝ ලබා නො දෙයි. චිත්තය හෝ රූපය හෝ ලැබුණු තොරතුරුවලින් සමහරක් ලබානොදෙන අතර අළුත් තොරතුරු ද එකතුකරයි. එසේ නොවන්නට, එකම තොරතුරු ලබාදෙන්නේ නම් අදාළ සත්ත්වයාගේ හෝ වස්තුවෙහි හෝ වෙනසක් නො සිදුවෙයි.

අප විසින් ඉහත නිර්මානයකෙරී ඇත්තේ ආකෘතියක් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. අනිත්‍ය අනාත්ම අනවබෝධයෙන් අපි මනස ගැන මෙන් ම ද්‍රව්‍ය ගැන ද ආකෘති නිර්මානයකරමු. සංකල්ප සංස්කරණයකිරීම ද මනසේ ගුණයක් වෙයි. සංඛාරය යනු නාමයෙහි අංගයක් වෙයි. පළමුව මනස නිර්මානයකරන මනස ඉන්පසු අනෙක් සංකල්ප සංස්කරණයකරයි. ඒ මනස ක්‍රියාකරන ආකාරයයි. එහෙත් එය ද අප විසින් නිර්මානය කෙරී ඇති ආකෘතියක් පමණක් බව අවධාරණය කළ යුතු ය.

© Prof. Nalin De Silva

මෙහි දී අවධාරණය කළයුතු තවත් කරුණක් වෙයි. එනම් ආකෘතියක් නිර්මානයකිරීම යන්නෙන් පවත්නා දෙයක ආකෘතියක් තනන්නේ යැයි ගම්‍ය නොවන බව ය. ආකෘතිය යන්න එක් අතකින් ගත්කල වැරදි ව්‍යවහාරයක් වෙයි. ආකෘතිය යන්නෙන් පවත්නා යමක ගුණ ඇති වෙනත් දෙයක් යන්න ගම්‍ය වෙයි. අපට පෘථිවියේ ආකෘතියක් ගැන කතාකළ හැකි ය. පෘථිවියේ ආකෘතියක් යනු පෘථිවිය පවතින්නේ යැයි සලකමින් ඒ අනුව නිර්මානයකෙරෙන වස්තුවක් වෙයි.

එහෙත් මෙහි සඳහන් ආකෘතිය එවැන්නක් නො වෙයි. අපට තැනීමට සිදුවී ඇත්තේ පවත්නා යමක ආකෘති නො වෙයි. අප නිර්මානයකර ඇත්තේ මනසෙහි හෝ වස්තුවක හෝ ආකෘතියක් නො වෙයි. අප නිර්මානයකර ඇත්තේ මනස ම ය. නැතහොත් වස්තුව ම ය. මනසෙහි ආකෘතියක් නිර්මානයකර ඇතැයි කී විට මනස යනුවෙන් යමක් පවතින බව ගම්‍ය වෙයි. වස්තුව සම්බන්ධයෙන් ද එසේ ම ය. එසේ මනසක් හෝ වස්තුවක් හෝ පවතින්නේ යැයි ගැනීම ම ආත්මවාදී වෙයි.

අප කරන්නේ අනිත්‍ය දුක්ඛ අනාත්ම අනවබෝධයෙන් ආකෘති නිර්මානයකිරීම මිස පවත්නා යමක ආකෘති නිර්මානයකිරීම නො වෙයි. නාම, රූප, මනස, ද්‍රව්‍ය, වස්තු ආදී මේ සියල්ල අප විසින් නිර්මානය කෙරෙන ආකෘති වන්නේ ඉහත සඳහන් අර්ථයෙන් මිස පවත්නා යමක ආකෘති වශයෙන් නො වෙයි. කාලය යන්න ද අප විසින්, එනම් සවිඥානික සත්ත්වයන් විසින් නිර්මානයකෙරෙන ආකෘතියකි. මේ ආකෘතිවලට සංකල්ප යන්න වඩා යෝග්‍ය වෙයි. සංකල්පය ද නිර්මානයක් වන අතර එහි පවත්නා දෙයක ආකෘතියක් යන තේරුම නැත. ප්‍රවාද ද එලෙසම අපේ නිර්මාන වෙයි. අවසානයේ දී මුළු ලෝකය ම (විශ්වය ම) අපේ නිර්මානයක් වෙයි. අප එකිනෙකා නිර්මානය කරන්නේ එකම ලෝකයක් නොවන බවත් ඒ ඒ අයගේ ලෝක යනු ඒ ඒ අයගේ සංකල්ප, ප්‍රවාද ආදියෙහි එකතුවක් බවත් මෙයින් කියැවෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva